# කම්ලා භාසින්



කම්ලා භාසින් (24 අප්‍රේල් 1946-25 සැප්තැම්බර් 2021) ඉන්දියාවේ කාන්තා ව්‍යාපාරයේ ප්‍රබල චරිතයකි. ඇගේ ආත්මය, බුලන්ඩ් වාස් (ශක්තිමත්, උස් ස්වරය), සටන් පාඨ, කවි, ගීත, ලේඛන සහ කථා සාමාන්‍ය මිනිසුන් මෙන්ම විද්වතුන් අතර ද අනුනාද වූ අතර, ඇය ස්ත්‍රීවාදී ව්‍යාපාරයේ නායිකාවක් ලෙස කැපී පෙනුණි.

කම්ලා 1998 අප්‍රේල් මාසයේදී දකුණු ආසියාතික කාන්තා ජාලයක් වන සන්ගට් සම නිර්මාතෘවරියකි. ඇය ඉන්දියාවේ කාන්තා අයිතිවාසිකම් සම්බන්ධ රාජ්‍ය නොවන සංවිධානයක් වන ජාගොරි හි සම-නිර්මාතෘවරියක් ද වේ. ඇය පොත්, ගීත සහ කථා ලියා ප්‍රකාශයට පත් කළ අතර, ඒවායින් බොහොමයක් භාෂා 30කින් පමණ මුද්‍රණය වී ඇත. බිලියනයක් නැඟී එන ගෝලීය ව්‍යාපාරයේ අත්‍යවශ්‍ය චරිතයක් වන ඇය 2005 වසරේ නොබෙල් සාම ත්‍යාගය සඳහා කාන්තාවන් 1000 වැඩසටහනේ සම්බන්ධීකාරකවරියක වූවාය.

පෞද්ගලික වියෝවන් සහ බේදවාචකයන් නිසා අධ්‍යාත්මික ජීවිතයේ ගැඹුරු අර්ථය සෙවීමට ඇයව පෙලඹවූ අතර, ඇය සියලු ආගමික ඉගැන්වීම්වලට ප්‍රතිචාර දැක්වූවත්, තිච් නට් හාන් සහ බෞද්ධ දර්ශනයේ අනුගාමිකයෙකු බවට පත්විය.



# කම්ලා භාසින් සම්මානය

## ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය දකුණු ආසියාව පුරා ක්‍රියාත්මක කිරීම

මෙම සම්මානය සෑම වසරකම දකුණු ආසියාවේ පුද්ගලයින් දෙදෙනෙකු වෙත පිරිනැමේ

- දකුණු ආසියාව පුරා සාම්ප්‍රදායික නොවන ජීවනෝපායන්හි සිටින කාන්තාවන් සැමරීම සඳහා වූ සම්මානයක් සහ
- ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය සඳහා ක්‍රියා කරන පුරුෂයින් ඇගයීම සඳහා සම්මානයක්

සම්මාන කාණ්ඩ දෙකටම සිස් සහ ට්‍රාන්ස් පුරුෂයින් සහ කාන්තා ඇතුළත් වේ.

සම්මානය සමන්විත වන්නේ : ඉන්දියානු රුපියල් 100,000 ක ත්‍යාග මුදලක් සමග කුසලානයක්.

සම්මානලාභීන්ට දකුණු ආසියාව පුරා සේවය කරන වෙනස් කිරීමේ නියෝජිතයන්, සංවිධාන, පරිත්‍යාගශීලීන්ගෙන් සම-ඉගෙනීම සඳහා, සම්බන්ධ වීමට සහ ජාලගත වීමට මෙය හොඳ අවස්ථාවක් වනු ඇත

## අයදුම් කළ හැක්කේ කාටද?

දකුණු ආසියාවේ ඕනෑම රටක පදිංචිව සිටින සහ සේවය කරන එනම් ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන දකුණු ආසියාතික පුරවැසියන්ට අපි අයදුම් කිරීමට ආරාධනා කරමු.

රටවල් අටේ සියලුම නිල භාෂාවලින් අයදුම්පත් භාරගනු ලැබේ.

## සම්මාන කාණ්ඩ

1. සාම්ප්‍රදායික නොවන ජීවනෝපායක යෙදෙන සහ ප්‍රගුණ කරන කාන්තා (cis/සංක්‍රාන්ති ලිංගික) වෘත්තිකයෙක්.
2. පිරිමි ළමුන්/පුරුෂයින් සමග වැඩ කිරීමෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සරිලන පරිසර පද්ධතියක් සක්‍රීය කිරීමට කටයුතු කර ඇති පිරිමියෙක් (cis/සංක්‍රාන්ති ලිංගික)

# තේරීමේ නිර්ණායක



## 1 කාණ්ඩය

- පසුගිය වසර 3 තුළ ඇයගේ/ඔවුන්ගේ සන්දර්භය තුළ සම්ප්‍රදායික නොවන ජීවනෝපායක් ප්‍රගුණ කිරීම
- ඇය/ඔවුන්ගේ ඉපැයීම් පමණක් නොව, ඇයගේ/ඔවුන්ගේ ජීවිතයද පාලනය කර ගැනීමට තමන්/තමන්ම සවිබල ගන්වා ඇත.
- වෙනස් කිරීමේ නියෝජිතයෙකු වන අතර අන් අයට අවස්ථා නිර්මාණය කරයි.

සාම්ප්‍රදායික නොවන ජීවනෝපායන් යනු කිසියම් කුලයකට, ප්‍රජාවකට, ආගමික කණ්ඩායමකට අයත් වීම හෝ ඔවුන්ගේ ලිංගික නැඹුරුව, ඔවුන්ගේ ලිංග අනන්‍යතාවය, ආබාධිතභාවය, ඔවුන්ගේ වාසස්ථාන (මෙම ලැයිස්තුව තව දිගු විය හැකි අතර - ඕනෑම සමාජයක පවතින වෙනස්කම් කර සැලකීමේ ව්‍යුහයන් මත පදනම්ව වෙනස් විය හැක) යන මෙම හේතු නිසා කාන්තාවන් සීමා කෙරන ඔවුන් වටා ඇති වීදුරු සිවිලිම නැතහොත් කොන්ක්‍රීට් සිවිලිම් සහ බිත්ති කඩා දමන ජීවනෝපායන්ය.. වැටුප් නොලබන වැඩ සහ ගමනාගමනය වටා ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්මතයන් නිදසුනක් වශයෙන්, කාන්තාවන්ට දිවා කාලයේ සහ රාත්‍රියේ විශාල වශයෙන් නිවසින් බැහැරව සිටීමට අවශ්‍ය වන රිය පැදවීම හෝ පෙදරේරු වැනි රැකියා කිරීමට ඉඩ නොදීමට එක් හේතුවක් වී ඇත. ඔබට මෙම සබැඳිය ක්ලික් කිරීමෙන් සාම්ප්‍රදායික නොවන ජීවනෝපායන් සහ කලාපය වටා ඇති උදාහරණ කිහිපයක් ගැන වැඩිදුර කියවිය හැක.

## කාණ්ඩය 2

- පසුගිය වසර 5 තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සාධාරණත්වය සපිරි ලෝකයක් කරා පිරිමි ළමුන්/පුරුෂයින් සමඟ වැඩ කිරීම.
- රැකවරණ කටයුතු සඳහා දායක වීම, කාන්තා නායකත්වය පිළිගැනීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජ-සංස්කෘතික සම්මතයන් සියල්ලටම එරෙහිව සටන් කිරීම මගින් පුද්ගලික සහ රැකියා ජීවිතයේ හානිකර ආරූඪ කරගත් පිරිමිකම/ පුරුෂාධිපත්‍යයට එරෙහි වීම.
- වෙනස් කිරීමේ නියෝජිතයෙකු වන අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවී සාධාරණත්වය සපිරි ලෝකයක් සක්‍රීය කිරීමට අනෙකුත් පිරිමින්ට බලපෑම් කර ඇත.

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා පිරිමි ළමයින් හා පුරුෂයින් සම්බන්ධ කර ගැනීම වර්ධනය වන ව්‍යාපාරයකි. කම්ලාගේ සටන් පාඨය වන "යහපත් තත්ත්වයේ මිනිසුන් සමානාත්මතාවයට බිය නැත" යන පාඨය පුරුෂාධිපත්‍ය සම්මතයන්ට, පුරුෂයින් අභියෝග කිරීමේ වැදගත්කම ඉස්මතු කරයි. මෙම කාණ්ඩය තම ජීවිත තුළ පීතෘමූලික පිළිවෙත් පරීක්ෂා කර, ඔවුන්ගේ වරප්‍රසාද පිළිගෙන, පුරුෂාධිපත්‍යයේ සීමා සහිතකම හඳුනාගෙන සිටින පුරුෂයින් පිළගැනීම අරමුණු කරයි. හානිකර භාවිතයන්ට මුහුණ දීමට, කාන්තාවන්ට සහ ලිංගික සුළුතරයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට විරුද්ධ වීමට, නිවසේ රැකවරණ කටයුතු සඳහා වගකීම බෙදා ගැනීමට සහ කාන්තාවන්ට සහ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් ඉල්ලා සිටීමට සහය දැක්වීමට වෙනත් පුරුෂයින් සමඟ ක්‍රියාකාරීව වැඩ කරන පුරුෂයින් අපි සොයන්නෙමු. අපගේ ඉලක්කය වන්නේ මෙම වෙනස් කිරීමේ නියෝජිතයින්ට එකිනෙකාගෙන් ඉගෙන ගැනීමට සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය වෙනුවෙන් පෙනී සිටීමට අන් අයව පොළඹවා ගැනීමට උපකාරක පරිසරයන් ඇති කිරීමයි.

## කාලරේඛාව

2024 **මාර්තු** 8 : අයදුම් කිරීමේ ක්‍රියාවලිය විවෘත කිරීම

2024 **ජූනි** 30: අයදුම් කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීම

2024 **ජූලි-අගෝස්තු**: අපේක්ෂකයින් තෝරා ගැනීමේ කෙටි ලැයිස්තුව සහ සම්මුඛ පරීක්ෂණය

2024 **සැප්තැම්බර්**: ජයග්‍රාහකයින් නිවේදනය කිරීම

**නොවැම්බර්** 30: නවදිල්ලියේ සම්මාන උළෙල පැවැත්වීම



# ජූරි සභාව

## බංගලාදේශය



**කුෂි කබීර්** සමාජ ක්‍රියාකාරිනියක්, ස්ත්‍රීවාදියෙක් සහ පරිසරවේදියෙක්. ඇය දැනට නිජෙර බොරි හි සම්බන්ධීකාරක වේ.
ඇය ප්‍රතිපත්ති සංවාද මධ්‍යස්ථානයේ සාමාජික, මණ්ඩල භාරකරුවන් වැනි විවිධ ජාතික, කලාපීය සහ ගෝලීය සංසදවල ගෞරවනීය තනතුරු දරන අතර - සංගට් සඳහා කලාපීය උපදේශක මෙන්ම බිලියනයක් නැගී එන ගෝලීය ව්‍යාපාරයේ බංග්ලාදේශ සම්බන්ධීකාරක ලෙස ඇය සම්බන්ධ වේ

## නේපාලය



**බින්ද පාණ්ඩේ** යනු නේපාල දේශපාලන ක්‍රියාකාරිනියකි. ඇය 1 වන නේපාල ව්‍යවස්ථාදායක සභාවේ (2008-2012) සාමාජිකාවක් වූ අතර දැනට නේපාලයේ කොමියුනිස්ට් පක්ෂය නියෝජනය කරන ෆෙඩරල් පාර්ලිමේන්තුවේ සාමාජිකයෙකි. ඇය 2004-09 කාලය තුළ නේපාල වෘත්තීය සමිති මහා සම්මේලනයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරිය වූවාය. ඇය දශකයක් (2011-2021) ILO ජාත්‍යන්තර කම්කරු සංවිධානය පාලක මණ්ඩලයේ ආසියා පැසිෆික් වෘත්තීය සමිතිය නියෝජනය කළාය. ඇය " නේපාල වෘත්තීය සමිති ව්‍යාපාරයේ කාන්තා සහභාගීත්වය" සහ "නේපාල දේශපාලනයේ කාන්තාවන්" යන ග්‍රන්ථ ලියා ඇත.

## ඉන්දියාව



**අනු අග** පුහුණුව තුලින් පත්වූ සමාජ සේවිකාවකි. තර්මැක්ස් මණ්ඩලය විසින් අනු අගව විධායක සභාපතිනිය ලෙස පත් කරන ලදී. විශ්‍රාම ගැනීමෙන් පසු ඇය ආර්ථික වශයෙන් අඩු පහසුකම් සහිත ප්‍රාථමික අධ්‍යාපනය සඳහා කාලය කැප කළාය. ඇය දශක 2 කට වැඩි කාලයක් ආකාන්ෂා හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සිට ඇති අතර, ඉන්දියාවට උගන්වන්න (TFI) දියත් කිරීමට උදව් කළාය. ඇය TFI හි සභාපතිනිය ලෙස විශ්‍රාම ගිය අතර තවමත් ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටී. අනු ඉන්දියානු කර්මාන්ත සම්මේලනයේ (CII) ක්‍රියාකාරීව සිට ඇත. ඇය රාජ්‍ය සභා මන්ත්‍රීවරියක ලෙස වසර 6ක් සේවය කළාය.



**නමිට භන්ඩරෙ** යනු මැගසින් සන්ඩේ, ඉන්ඩියා ටුඩේ සහ දිනපතා හින්දුස්ථාන් ටයිම්ස් ඇතුළු විවිධ ප්‍රකාශන සමග වසර 30 ක වාර්තාකරණ පළපුරුද්දක් ඇති සම්මානලාභී මාධ්‍යවේදියෙකි. 2013 දී, ඇය මින්ට් පුවත්පත සඳහා ඉන්දියාවේ පළමු ස්ත්‍රී පුරුෂ සමාජභාවී කතුවරයා ලෙස පත් කරන ලද අතර 2016 දක්වා එහි සිටියාය. ඇය කාන්තාවන් සහ වැඩ පිළිබඳ ලිපි මාලාවක් ලියා ඇත.



## පකිස්ථානය



**මුනිසේ ජාහන්ගිර්** යනු මානව හිමිකම් ගැටළු කෙරෙහි අවධානය යොමු කරන පාකිස්තානයේ පළමු ඩිජිටල් මාධ්‍ය වේදිකාව වන Voicepk.net හි ප්‍රධාන කර්තෘ වේ. ඇය සම්මානලාභී රූපවාහිනී මාධ්‍යවේදිනියක් සහ වාර්තාමය චිත්‍රපට නිෂ්පාදකවරියක් වන අතර, දැනට අජා රූපවාහිනියේ “ස්පොට්ලයිට්” නමින් ප්‍රයිම්-ටයිම් කාලීන සිදුවීම් වැඩසටහනක් ඉදිරිපත් කරයි. ඇය පකිස්ථානයේ මානව හිමිකම් කොමිසමේ තේරී පත් වූ සභා සාමාජිකාවකි. SAHR (මානව හිමිකම් සඳහා දකුණු ආසියානුවන්) හි තේරී පත් වූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් සහ SAWM (මාධ්‍ය තුළ දකුණු ආසියානු කාන්තාවන්) හි නිර්මාතෘවරියකි. ඇය 2008 දී WEF විසින් තරුණ ගෝලීය නායිකාවක් ලෙස ගෞරවයට පාත්‍ර විය.

## ශ්‍රී ලංකාව



**රාධිකා කුමාරස්වාමි** කීර්තිමත් නීතීඥවරියක්, රාජ්‍ය තාන්ත්‍රික නිලධාරිනියක් සහ මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින නීතීඥවරියක් වන අතර ඇය 2006 වසරේ සිට 2012 වසරේ විශ්‍රාම යන තුරුම එක්සත් ජාතීන්ගේ උප මහලේකම්වරිය (Under Secretary General of the United Nations) ලෙසත් ළමා හා සන්නද්ධ ගැටුම් පිළිබඳ මහලේකම්වරයාගේ විශේෂ නියෝජිතවරිය ලෙසත් කටයුතු කළාය. 1994 සිට 2003 දක්වා ඇය කාන්තාවන්ට එරෙහි හිංසනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ නියෝජිත විශේෂ වාර්තාකරු ලෙසත් සේවය කලාය. 2017 දී ඇය මියන්මාරය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කරුණු සෙවීමේ දූත මණ්ඩලයට පත් කරන ලද අතර මැදිහත්වීම් පිළිබඳ මහලේකම්වරයාගේ උපදේශක මණ්ඩලයේ සාමාජිකාවක් ලෙස ද පත් කරන ලදී. 2022 ජුනි මාසයේදී ඇය ඉතියෝපියාවේ මානව හිමිකම් පිළිබඳ විශේෂඥයින්ගේ ජාත්‍යන්තර කොමිසමේ සාමාජිකාවක් ලෙස පත් කරන ලදී.



# සම්මානය පිටුපස ඇති සංවිධාන

## Azad Foundation

අසාද් පදනම යනු සමාජ හා ආගමික බෙදීම් හරහා ක්‍රියා කරන ස්ත්‍රීවාදී සංවිධානයක් වන අතර, සම්පත් වලින් අඩු කාන්තාවන්ට ස්ථිරසාර සම්ප්‍රදායික නොවන ජීවනෝපාය විකල්පයන්හි නියැලීමට සහ ඔවුන් සවිබල ගැන්වීමට හැකි වන ලෙස කටයුතු කරයි.

අසාද් හි වැඩ ගැන වැඩිදුර කියවීමට කරුණාකර මෙම සබැඳියට යන්න - **www.azadfoundation.com**

## iPartner India, UK

එක්සත් රාජධානිය පදනම් කරගත් පුණ්‍යායතනයක් වන iPartner India, UK, වඩාත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සාධාරණ සහ සමානාත්මතාවයෙන් යුත් ඉන්දියාවක් නිර්මාණය කිරීමේ දැක්මක් ඇත - දරිද්‍රතා මට්ටම් සැලකිය යුතු ලෙස අඩු වී ඇති සහ ස්ත්‍රී පුරුෂ භාවය, කුලය හෝ සමාජ ආර්ථික පසුබිම යන භේදයකින් තොරව සෑම පුද්ගලයෙකුටම සමාන අවස්ථා ඇති ඉන්දියාවක් නිර්මාණය කිරීමේ දැක්මක් ඇත. අප වසර 16ක පළපුරුද්ද සහ ප්‍රවීණත්වය සමගම සෘජුවම බිම් මට්ටමේ සමීපව කටයුතු කිරීම සහ අඩු වරප්‍රසාද ලත් අයගේ ජීවිත පරිවර්තනය කරන දේශීය රාජ්‍ය නොවන සංවිධාන සමඟ හවුල්කාරිත්වයේන් කටයුතු කරයි.

iPartner India, UK හි වැඩ ගැන වැඩිදුර කියවීමට කරුණාකර යන්න් iPartner India ආන්තික හඬවල් ඇසීම

## ඉන්දියාව සඳහා ජාතික පදනම

ඉන්දියාවේ ජාතික පදනම ( NFI ) යනු සිවිල් කටයුතු, ප්‍රතිචාරාත්මක ප්‍රතිපත්ති සම්පාදනය සහ සමාජ වගවීම තුළින් සමාජ සාධාරණත්වය සක්‍රිය කිරීමට කැපවී සිටින සංවිධානයකි. සමාජ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා, NFI පසුගිය දශක තුන තුළ ප්‍රාන්ත 14 ක බිම් මට්ටමේ සිවිල් සමාජ සංවිධාන 500 කට අධික සංඛ්‍යාවක් සමඟ වැඩ කර ඇත. වර්තමානයේ NFI දේශගුණික විපර්යාස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සිවිල් අවකාශය සහ ව්‍යවස්ථාපිත වටිනාකම් ප්‍රවර්ධනය යන සිය වැඩසටහන් හරහා දලිත්, ආදිවාසි සහ සුළුතර ප්‍රජාවන් සමඟ කටයුතු කරයි

ඉන්දියාව සඳහා ජාතික පදනමේ වැඩ ගැන වැඩිදුර කියවීමට කරුණාකර මෙම සබැඳියට පිවිසෙන්න **https://www.nfi.org.in/**